# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2090/39 - 2018 සැප්තැම්බර් මස 28 වැනි සිකුරාදා - 2018.09.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී 9/2011

### 1963 අංක 11 දරන මුදල් පනත

72 වන වගන්තිය යටතේ වූ නියමය

1963 අංක 11 දරන මුදල් පනතේ 71 වන වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 72 වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය මංගල සමරවීර වන මම, මෙහි උපලේඛනයෙහි විස්තර කර ඇති දේපළ වර්ෂ දෙදහස් දහඅටක් වූ සැප්තැම්බර් මස 28 වන දින සිට බලාත්මක වන පරිදි, 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ පිහිටුවන ලද මහජන බැංකුව වෙත මේ නියමය මගින් පවරා දෙමි.

මංගල සමරවීර,<br>
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය.

2018 සැප්තැම්බර් මස 28 වැනි දින,<br>
කොළඹ දී ය.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, මැද පත්තුවේ, ගම්පහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බැලුම්මහර අංක 239 දරන ග්‍රාමසේවා වසම තුළ පිහිටි ''කැකුණගහලන්ද '' නමැති ඉඩමට ජී. එල්. බී. නානායක්කාර බලයලත් මිනින්දෝරු තැන විසින් මැන සාදන ලද 1990.08.15 වන දින සහ අංක 8996 දරන පිඹුර ප්‍රකාරව බෙදා වෙන් කරන ලද කැබලි අංක 17 දරන කොටසට මායිම්, උතුරට : අංක 18 දරන කැබැල්ල ද, නැගෙනහිරට : අංක 15 සහ 16 දරන කැබලි ද, දකුණට : අංක 48 දරන කැබැල්ල ද, බස්නාහිරට : අංක 07 දරන කැබැල්ල ද මායිම් වූ පර්චස් දහසයයි දශම හතයි බිංදුව (අ. 00, රූ. 00, පර්. 16.70) ක් විශාල ඉඩම සහ එහි පිහිටි අංක 278/17 දරන නිවස ද, ඊට අයත් ගහකොළ, පළතුරු ආදී සියලු දේත් වේ.

මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 355/212 යටතේ ලියාපදිංචි වී ඇත.

10 - 448

1A - PG 4256 — 107 (2018/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*